2015 සැප්තැම්බර් 30 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

ADB ආසියානු සංවර්ධන බැංකුව

# ශ්‍රී ලංකාවඃ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- ණය වාරික 1

| | |
|---|---|
| ව්‍යාපෘති නාමය | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- ණය වාරික 1 |
| ව්‍යාපෘති/ වැඩසටහන් අංකය | 47381-002 |
| රට | ශ්‍රී ලංකාව |
| තත්වය | අනුමැතිය ලැබී ඇත |
| ව්‍යාපෘති වර්ගය/ සහායේ ප්‍රකාරතාව | ණය |
| අරමුදල් මූලාශ්‍රය / වටිනාකම | **ණය 3267-SRI: මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- ණය වාරික 1**<br>සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් — ඇ.එ.ජ ඩොලර් මිලියන 76.00<br>**ණය 3268-SRI: මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- ණය වාරික 1**<br>ආසියානු සංවර්ධන අරමුදල — ඇ.එ.ජ ඩොලර් මිලියන 74.00 |
| ක්‍රමෝපාය න්‍යාය පත්‍රය | පාරිසරික වශයෙන් ධරණීය වර්ධනය (ESG)<br>සමස්ත ආර්ථික වර්ධනය (IEG) |
| වෙනස්වීමේ තීරක | පරිපාලන සහ ධාරිතා සංවර්ධනය (GCD)<br>දැනුම් මූල විසඳුම්<br>හවුල්කාරිත්වය |
| ක්ෂේත්‍රය සහ/ හෝ උපක්ෂේත්‍ර වර්ගීකරණය | **කෘෂිකර්මය, ස්වභාවික සම්පත් සහ ග්‍රාමීය සංවර්ධනය-**<br>වාරිමාර්ග- ජල-පාදක ස්වභාවික සම්පත් කළමනාකරණය |
| ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරා වර්ගීකරණයන් | ස්ත්‍රී/පුරුෂ අංග අඩංගු නොවේ |
| විස්තරය | කෘෂි නිෂ්පාදන සහ කුටුම්භ ආදායම පහළ මට්ටමක පවතින වියළි කලාප වෙතට මහවැලි ගංගාවේ අතිරේක ජලය රැගෙන යාමට ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් එක්ව කටයුතු කරයි. උතුරුමැද පලාත, මධ්‍යම පලාත, වයඹ පලාත සහ නැගෙනහිර පලාතෙහි වියළි කලාප වෙත රටේ විශාලම ගංගාවේ ජලය ගෙයාමේ දශක ගණනාවක් පැරණි වැඩසටහන සම්පූර්ණ කිරීමට 'මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන' මගින් රජයට සහය වෙයි. ව්‍යාපෘතිය මගින් කිලෝමීටර 260 ඉක්මවූ අළුත් සහ වැඩිදියුණු කරනලද ඇළ මාර්ග, ජලාශ සහ වෙනත් වාරි මාර්ග යටිතල පහසුකම් ගොඩනගනු ඇත. එසේම ජල කළමනාකරණය සහ ජලය බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යනයන් සිදු කීරීමටද සහය දක්වයි. වාරිමාර්ග ජලය සැපයීමට අමතරව බොහෝ කලක සිට දක්නට ලැබෙන වකුගඩු ආශ්‍රිත රෝග බහුලව පවතින ප්‍රදේශ වල ප්‍රජා සෞඛ්‍යය ඉහළ නැන්වීම සඳහා 350,000 කට අධික |

| | |
|---|---|
| | පිරිසකට පිරිසිදු පානීය ජලය ලබාදීමද මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ. ආර්ථික වර්ධනය සහ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නන්වන අතරතුර, දිලිදුබව අඩුකරලීමද මෙම ව්‍යාපෘතියේ දිගුකාලීන අරමුණකි. |
| ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය | ශ්‍රී ලංකාව සුවිසල් ජල සම්පතකට උරුමකම් කීවද, එම සම්පත රට පුරා බෙදාහැරීම තවමත් නිසි පරිදි සිදු කර නොමැත. රටේ සමස්ත ජනගහනයෙන් තුනෙක් එකකට වියලි කලාපය (උතුරු මැද පලාත, මධ්‍යම පලාත, වයඹ පලාත සහ නැගෙනහිර පලාත ඇතුළත්ව) විසින් වාසස්ථානය සපයන අතර ග්‍රාමීය පදිංචිකරුවන්ගෙන් 70% ක් පමන සිය ජීවිකාව සපුරා ගැනීම සඳහා කෘෂිකර්මාන්තය මත රැදී පවතී. කෙසේ වෙතත් මෙම කලාපයට වසරක් තුළ මිලිමීටර් 1500 කට අඩු වර්ෂාපතනයක් පමණක් ලැබෙන අතර කෘෂිකාර්මික නිෂ්පාදන ඵලදාව කෙරෙහි සැලකියයුතු අයුරින් බාදා ගෙන දෙන්නාවූ නියගය මෙම කලාපයට පොදු තත්වයකි. දේශීය ප්‍රජාව විසින් කුඩා ජලාශ පරිවහන ඇළ සහ වාරිමාර්ග ක්‍රම ගොඩනගා ගැනීම හරහා මෙම තත්වය කළමනාකරණය කර ගෙන ඇත. සෑම වසරකම එක් වී කන්නයක් සඳහා අතිරේක ජලය සැපිරීමට සහ පානීය ජල සැපයුම සඳහා සීමා සහිත ජලය ප්‍රමාණයක් ගබඩා කර ගැනීමට මේවා ප්‍රමාණවත් වේ.<br>බොහෝ ප්‍රදේශවල ප්‍රජාව භූගත ජලය මත රැදී සිටින අතර ඇතැම් විට මෙම ජලය කාලයක් සිට දක්නට ලැබෙන වකුගඩු රෝග පැතිරීම සඳහා හේතුවී ඇතැයි විශ්වාස කරයි. සමාජ සහ ආර්ථික සංවර්ධනය අභිබවා යමින්, වසර පුරාවට ප්‍රවේශය පවතින ජල සැපයුමක් නොතිබීම කෘෂි සහ වාණිජ නිෂ්පාදන සීමා කිරීමට හේතුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ වෙනත් ප්‍රදේශ වලට සාපේක්ෂව මෙම ප්‍රදේශයන්හි සාමාන්‍ය කුටුම්භ ආදායම 10% ක් පමණ පහත මට්ටමක පවතී. ක්‍රමයෙන් ජනගහනය වර්ධනය වීම සහ දේශගුණික විපර්යාශ හේතුවෙන් වර්ෂාපතනය පහත වැටීම හරහා තත්වය තවත් බරපතල වනු ඇතැයි විශ්වාස කරයි. |
| බලපෑම | උතුරු මැද පලාත, මධ්‍යම පලාත, වයඹ පලාත සහ නැගෙනහිර පලාත තුළ වැඩි දියුණුවූ කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ධරණීය ආර්ථික වර්ධනය |
| **ව්‍යාපෘති ප්‍රතිඵල** | |
| ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ව්‍යාපෘති ප්‍රදේශ තුළ කෘෂිකාර්මික සහ පානීය ජල අවශ්‍යතා සඳහා සුරක්ෂිත ප්‍රවේශය |
| ප්‍රතිඵල දෙසටවූ ප්‍රගතිය | |
| **ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය** | |
| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | 1. නව සහ වැඩිදියුණුවූ ජලය ගෙනයෑමේ සහ ගබඩා කිරීමේ යටිතල පහසුකම් ගොඩනැගීම<br>2. ජල සම්පත් කළමනාකරණය දියුණු කිරීමට සහ ඵලදායීතාවය සංවර්ධනය කිරීමට පද්ධති<br>3. බහු අංශ ආයෝජන වැඩසටහන් කළමනාකරණ මෙහෙයුම් |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) | | |
| භූගෝලීය පිහිටීම | | |
| **ආරක්ෂණ වර්ගීකරණයන්** | | |
| පරිසරය | | A |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | | B |
| ආදිවාසී ජනතාව | | C |
| **පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය** | | |
| පාරිසරික අංගය | පරිසරය සඳහාඃ ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය A ඛාණ්ඩයට අයත් වන අතර පාරිසරික බලපෑම් තක්සේරුව සකසා ඇත. වයඹ පලාත් ඇළ ව්‍යාපෘතියද A ඛාණ්ඩයේ වන අතර නවීන පාරිසරික බලපෑම් තක්සේරුව සකසා ඇත. මිනිපේ වම් බැංකු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය B ඛාණ්ඩයට අයත් වන අතර ආරම්භක පාරිසරික විමර්ෂණය සකසා ඇත. | |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් සඳහාඃ ආයෝජන වැඩසටහනේ පළමු ණය වාරිකය B කාණ්ඩය වන අතර නැවත පදිංචි කිරීමේ සැලැස්ම සකසා ඇත. ආයෝජන වැඩසටහන සඳහා නැවත පදිංචි කිරීමේ ආකෘතියද සකසා ඇත. | |
| ආදිවාසී ජනතාව | | |
| **පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය** | | |
| ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර | ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරුවන් යටතට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති පලාත්හි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග ජලයෙහි අවසන් භාවිත කරන්නන් සහ ප්‍රතිලාභකරුවන් වන ගොවීන් මෙන්ම ජලය මාරුකිරීම සඳහා නව ඇළ මාර්ග වලට ඉඩ සැලසීමට නැවත පදිංචි කල යුතු සමස්ත බහු අදියර මූල්‍යකරණ පහසුකම් (MFF) තුළ බලපෑමට ලක්වූ ආසන්න වශයෙන් 194 ක් වන බලපෑමට ලක්වූ පවුල් අඩංගු වේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘති නිර්මාණය කෙරෙහි වගකීමෙන් බැඳී සිටී. නැවත පදිංචි කිරීමේ සැලසුම් අභ්‍යාශයන්හි උපදේශණ හරහා ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් සම්බන්ධ වනු ඇත. | |

| | |
|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර | මිනිසුන් නැවත පදිංචිරීම් කෙරෙහි අවම වශයෙන් බලපෑමට ලක්වන ආකාරයට සහ මිනිසුන් විසින් අත්පත්කරගෙන ඇති අලින්ගේ වාසභූමි ප්‍රමාණය ඉහළ නැන්වීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සමන්විත මූලික පාර්ශවකරුවන් ව්‍යාපෘතියෙහි තාක්ෂණික නිර්මාණය සමග දැනටමත් සම්බන්ධව සිටී. නොසලකාහැර ඇති සහ දිළිඳු පවුල් ඇතුළත්ව ව්‍යාපෘතියෙහි බලපෑමට ලක්වූ පවුල් නැවත පදිංචිකිරීමේ ආකෘතිය නිර්මාණයට සහ නැවත පදිංචිකිරීමේ සැලසුම් අභ්‍යාශයන් සම්බන්ධයෙන් ව්‍යාපෘති නිර්මාණයට සම්බන්ධ වනු ඇත. |
| **ව්‍යාපාරික අවස්ථාවන්** | |
| උපදේශණ සේවාවන් | සියළුම උපදේශණ කටයුතු ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශණ මාර්ගෝපදේශය අනුව ඉටුකෙරෙනු ඇත. කල්තියා ගිවිසුම්ගත කිරීම් සහ පූර්වකාරී මූල්‍යකරණ තෝරාගැනීම් භාවිතා කෙරේ. |
| ප්‍රසම්පාදනය | සියළුම ප්‍රසම්පාදන කටයුතු ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය භාවිත කරමින් සිදුකරනු ඇත. |

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | ලාන්ස් ගොරෙ |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | පාරිසරික, ස්වභාවික සම්පත් හා කෘෂිකර්ම අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**<br>SECRETARY@ENVIRONMENTMIN.GOV.LK<br>82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව |

| **කාලසටහන** | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | - |
| තොරතුරු සෙවීම | - |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | 2015 මාර්තු 13 |
| අනුමැතිය | 2015 ජූලි 02 |
| අවසන් විමර්ශණ මෙහෙවර | - |
| ව්‍යාපෘති දත්ත පත්‍රය අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ | 2015 සැප්තැම්බර් 08 |

## ණය 3267-SRI

| ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන | | | | | |
|---|---|---|---|---|---|
| අනුමැතිය | අත්සන් කල දිනය | බලාත්මක දිනය | අවසන් | | |
| | | | ප්‍රථම | සංශෝධනය | සැබෑ |
| 2015 ජූලි 02 | - | - | 2020 ජූනි 30 | - | - |

| මූල්‍ය සැලැස්ම | | ණය භාවිතය | | | |
|---|---|---|---|---|---|
| | සමස්ත අගය ( ඇ.එ.ජ ඩොලර් මිලියන ) | දිනය | ආ.ස.බැ | වෙනත් | ශුද්ධ අගය |
| ව්‍යාපෘති පිරිවැය | 116.00 | සමුච්චිත ගිවිසුම් ප්‍රධානය | | | |
| ආසියානු සංවර්ධන අරමුදල | 76.00 | 2015 ජූලි 02 | 0.00 | 0.00 | 0% |
| ප්‍රතිරූප අරමුදල් | 40.00 | සමුච්චිත ණය මුදාහැරීම් | | | |
| සහය මූල්‍යකරණය | 0.00 | 2015 ජූලි 02 | 0.00 | 0.00 | 0% |

## ණය 3268-SRI

| ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන | | | | | |
|---|---|---|---|---|---|
| අනුමැතිය | අත්සන් කල දිනය | බලාත්මක දිනය | අවසන් | | |
| | | | ප්‍රථම | සංශෝධනය | සැබෑ |
| 2015 ජූලි 02 | - | - | 2020 ජූනි 30 | - | - |

| මූල්‍ය සැලැස්ම | | ණය භාවිතය | | | |
|---|---|---|---|---|---|
| | සමස්ත අගය ( ඇ.එ.ජ ඩොලර් මිලියන ) | දිනය | ආ.ස.බැ | වෙනත් | ශුද්ධ අගය |
| ව්‍යාපෘති පිරිවැය | 74.00 | සමුච්චිත ගිවිසුම් ප්‍රධානය | | | |
| ආසියානු සංවර්ධන අරමුදල | 74.00 | 2015 ජූලි 02 | 0.00 | 0.00 | 0% |
| ප්‍රතිරූප අරමුදල් | 0.00 | සමුච්චිත ණය මුදාහැරීම් | | | |
| සහය මූල්‍යකරණය | 0.00 | 2015 ජූලි 02 | 0.00 | 0.00 | 0% |

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘති දත්ත පත්‍රයේ සඳහන් තොරතුරු එය භාවිත කරන්නන් සඳහා උපකරණයක් ලෙස භාවිතා කිරීමට කිසිදු සහතිකවීමක් නොමැතිව සපයයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහළ ගුණත්වයෙන් යුත් අන්තර්ගතයක් සැපයීමට සෑම විටම උත්සහ කරන අතර කිසිදු ආකාරයක වගකීමක් නොමැතිව, ප්‍රකාශිතව හෝ හැඟවීමෙන්, පණ්‍යයීය ආකාරයේ වගකීම් සීමාකම් නොමැතිවීම ඇතුළත්ව, නිශ්චිත අරමුණක් සඳහා ගැළපෙන පරිදි, උල්ලංඝනය නොවන ලෙස තොරතුරු "පෙනෙන පරිදි" සපයයි. මෙවන් ඕනෑම තොරතුරුහි නිරවද්‍යතාවය හෝ පරිපූර්ණත්වය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව විසින් විශේෂිතව ඕනෑම වගකීමක් සහ පෙනීසිටීමක් සිදුනොකරයි.